# අයවැයේ දේශපාලනය

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අපේ විරුද්ධතාව මැය රැගත් ලිපි පෙළ බයිලා කතුවරයාට පිළිතුරක් ලෙස ලියැවුණ ද එහි අරමුණ පාඨකයා දැනුම්වත් කිරීම මිස කතුවරයාට යමක් තේරුම් කරදීම නො වෙයි. නින්දෙන් නැගිට්ටවිය හැක්කේ සැබවින්ම නිදාසිටින්නකු මිස බොරුවට නිදන්නකු නො වේ. බුරුවකු ගඟක් ලඟට ඇදගෙන ගියත් ඌට වතුර පෙවිය නොහැකි යැයි කතාවක් තිබේ. බයිලා කතුවරයා තමාගේ වත්මන් පදනම අත්හැරියොත් ඔහුට පැවැත්මක් නැතිවනු ඇත. මෙවැන්නන්ට කළහැකි හොඳම කාර්යය ප්‍රසිද්ධ වේදිකාවකට ආරාධනය කර ඔවුන්ගේ තරම බලාගැනීමට අනෙක් අයට ඉඩ සැළැස්වීම ය.

එහෙත් ලිපි පෙළ එක දිගට පිළිතුරක් ලෙස සන්තතිකව ලිවිය නොහැක්කේ එදිනෙදා දේශපාලනය පිළිබඳ විග්‍රහයක් ද කළ යුතුව ඇති බැවිනි. මෙකළ වැදගත් ම ප්‍රශ්නය වී ඇත්තේ අයවැය විවාදයේ දී ආණ්ඩුව පැරදේ ද යන්න ය. අයවැය ලේඛනය වැදගත්වන්නේ ආණ්ඩුවට ය. ඉදිරි මුදල් වර්ෂයේ දී ආණාඩුව පවත්වාගෙන යැම සඳහා මුදල් ලබාදෙන්නේ අයවැයෙනි. එය ජනතාවට එතරම් වැදගත් නැත. ජනතාව ඒ දකින්නේ ආණ්ඩුවට තම කටයුතු සඳහා ප්‍රතිපාදන සකසා ගැනීමේ දී බදු අඩු වැඩිකිරීම් මගින් තමන්ට සහනයක් සලසන්නේ ද නැත් ද යන දෘෂ්ටි කෝණයෙනි. ආණ්ඩුව අයවැය විවාදයෙන් පැරදුණහොත් ඉදිරි මුදල් වර්ෂය සඳහා පාර්ලිමේන්තුවෙන් මුදල් වෙන් නොකරන බව එයින් කියැවෙයි. එවිට ප්‍රජාතන්ත්‍රවාදය ගරුකරන ආණ්ඩුවක් ඉල්ලා අස්විය යුතු යැයි විපක්ෂය හා ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව කියනු ඇත.

එවැනි අවස්ථාවක ආණ්ඩුව අස්විය යුතු ද නැත් ද යන්න පිළිබඳව විවිධ මත තිබෙනු ඇත. එහෙත් අපට මෙහි දී වැදගත්වන්නේ ඒ මත නො වෙයි. මේ අවස්ථාවේ දී ආණ්ඩුව අස්විය යුතු යැයි කියන්නෝ කවරහු ද යන්න අපට වැදගත් වෙයි. ඒ අන් කිසිවක් නිසා නොව එසේ අස්වීමෙන් එලෙස කියන්නන් බලාපොරොත්තු වන්නේ කුමක් ද යන්න අපට දැනගත හැකි බැවිනි. ආණ්ඩුව අස්වීම යනු ආණ්ඩුව වැට්ටවීම ය. ආණ්ඩුව වට්ටවන්නේ ජනතා විමුක්ති පෙරමුණේ ආණ්ඩුවක් පිහිටුවීම සඳහා නොවන බව ඒ පක්ෂය ද දනියි. ආණ්ඩුව වැට්ටවීමෙන් පසු පැහැදිලිව ම කොටින්ගේ පාර්ලිමේන්තු නියෝජිතයා වූ දෙමළ ජාතික සංධානයේ සහාය ලබන එ ජා ප ආණ්ඩුවක් පිහිටුවීම විජාතික බලවේගවල බලාපොරොත්තුව වෙයි. මේ පිටුපස බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ යටත්විජිතවාදය වෙයි.

එක්තරා ආකාරයකින් ගත්කල  දැක්ම නමින් පළවන මේ තීරුවේ තේමාව ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අපේ විරුද්ධතාව වෙයි. එසේ ම අපේ දැක්ම වන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පරාජය කිරීම ය. ඒ පහසු කාර්යයක් නොවුණ ද ඒ කළ යුතු වෙයි. එපමණක් නොව ඒ කළහැකි ය. විදුසර පුවත්පතෙහි පළවන අපේ ප්‍රවාද ලිපි පෙළ ද දි අයිලන්ඩ් පුවත්පතේ පළවන තීරුව ද ඒ අරමුණින් ම ලියැවෙයි. එයට කල්ගත විය හැකි ය. එහෙත් නිවහල් ජාතියක් ලෙස බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පරාජය කිරීම හැර අපට වෙනත් විකල්පයක් නැත.

එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් පිහිටුවීමට විජාතික බලවේගවලට අවශ්‍යවන්නේ බඩු මිළ අඩු කිරීමටවත් දූෂණය නැතිකිරීමටවත් නො වෙයි. එ ජා පක්ෂයට ඒ දෙකෙන් එකක්වත් කළ නො හැකි ය. අද ලෝක වෙළෙඳපොළේ තෙල් මිල ඉහළ යැම සෑම රටකට ම ආර්ථික ප්‍රශ්න උදාකර ඇත. පසුගිය සතියේ පළවූ වාර්තාවක් අනුව එංගලන්තයේ ආහාර මිළ මේ වසරෙහි සියයට දොළහකින් ඉහළ ගොස් ඇත. ලංකාවේ බඩු මිළ ඉහළ යෑමේ ප්‍රතිශතය එයට වඩා වැඩි බව රහසක් නො වේ. එහෙත් තෙළ මිළ ඉහළ යෑමත් සමග සිදුවන භාණ්ඩ මිළ පාලනය කිරීම පහසු කාර්යයක් නො වෙයි.

අනෙක් අතට එ ජා ප ආණ්ඩුවක් යටතේ දූෂණය අඩුවේ යැයි අඩු තරමින් විජේදාස රාජපක්ෂ මහතාවත් විශ්වාස කරන්නේ යැයි සිතිය නො හැකි ය. පරණ එ ජා ප ආණ්ඩුවල දූෂණ පිළිබඳ වාර්තාව අප නොදන්නවා නො වේ. එමෙන් ම එ ජා පක්ෂයට ඊනියා ප්‍රජාතන්ත්‍රවාදය අමුතුවෙන් ම ඉගැන්වීමට සිදු වී ඇත.  එහි නායකත්වය සෑම අවස්ථාවක ම කුඩා කණ්ඩායමකට සීමා වී ඇත. රනිල් වික්‍රමසිංහ මහතාගේ සහෝදරයන් පක්ෂ නායකත්වයෙහි නැති බව සැබෑ ය. එහෙත් එ ජා පක්ෂයෙහි තීරණ ගැනෙන්නේ ඒ මහතා හා ඒ මහතාගේ සමීප මිතුරන් කිහිප දෙනකු විසින් බව එ ජා පාක්ෂිකයෝ දනිති.

© Prof. Nalin De Silva

එසේ නම් ඉතා පැහැදිව ම ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව ඇතුළු විජාතික බලවේග ආණ්ඩුව වැට්ටවීමට කටයුතු කරන්නේ කොටි සංවිධානය ආරක්‍ෂා කිරීමට ය. වෙනත් වචනවලින් කියන්නේ නම් කොටින්ට එරෙහිව කරගෙන යන මානුෂික මෙහෙයුම් නැවැත්වීමට හා ඊනියා සටන් විරාම ගිවිසුම අළුත්වැඩියා කිරීමට ය. ආරක්‍ෂක කටයුතු සඳහා මේ අයවැයෙන් මෙතෙක් නොවූ විරූ වාර්තාගත මුදලක් වෙන් කෙරී ඇත. විජාතික බලවේගවලට අවශ්‍ය වනුයේ මේ මුදල් ආණ්ඩුවට ලබා නො දීමට ය. අයවැයට විරුද්ධව ඡන්දය දෙන්නන් මෙන් ම ඡන්දය දීමෙන් වැළකී සිටින්නන් ද අවසාන වශයෙන් කරන්නේ කොටි පරාදකිරීමට ආණ්ඩුවට මුදල් ලබා නො දීම ය. මෙරට ඇතැම් ජනමාධ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන ආදිය බටහිර ක්‍රිස්තියානි නූතනත්ව යටත්විජිතවාදයේ අතකොළු පමණක් වෙයි. අද ආණ්ඩු පක්‍ෂයෙන් විපක්‍ෂයට යන මන්ත්‍රීවරු විජාතික බලවේග විසින් මෙහෙයවනු ලබන රූකඩ පමණක් වෙති. රූකඩ වීරයන් බවට පත්කෙරෙන්නේ ඒ සඳහා ම සැදී පැහැදී සිටින ජනමාධ්‍ය කිහිපයක් මගිනි. ඒ ජනමාධ්‍ය අතින් අද වීරයන් බවට පත්කෙරෙන මේ රූකඩ ඒ ජනමාධ්‍ය විසින් ම යථා කාලයේ දී විසිකර දැමෙනු ඇත. රූකඩ ජනමාධ්‍යයට මුළා වී වීරත්වයක් ආරෝපණය කරගැනීමට ඉදිරිපත්වීම සිය දිවි නසාගැනීමක් පමණක් ම වනු ඇත.

රටේ ස්වෛරීභාවය ආරක්‍ෂා කරගැනීම, කොටි ත්‍රස්තවාදය පැරදවීම හා පළල්ව ගත්කල දෙමල ජාතිවාදය පරාජය කිරීම අද දේශපාලනයේ ප්‍රධාන කාර්යයන් වී ඇත. ජනතා විමුක්ති පෙරමුණ මේ බව අවබෝධ කරගෙන ඇති බව පැහැදිළි ය. පසුගිය කාලයේ බඩු මිළ වැඩිවීම, දූෂණය ආදිය ගැන කතා කළ ජ වි පෙ අද ඒ සියල්ල පසෙකින් දමා අයවැය විවාදයේ දී පක්‍ෂව ඡන්දය දීම සඳහා ස්වෛරීභාවය රැකීම ඇතුළු කොන්දේසි හතරක් ආණ්ඩුවට ඉදිරිපත් කර ඇත්තේ දේශපාලනික වශයෙන් සංවේදී වූ ජනතාවට අවශ්‍ය කුමක්දැයි ඒ පක්‍ෂය දන්නා බැවිනි. ඒ ජනතාවට සවන් නොදී ජ වි පෙරමුණට පැවැත්මක් නැත.

දැනට අවුරුදු කිහිපයකට පෙර ගුණදාස අමරසේකර මහතා ජ වි පෙ සිය දිවි නසාගන්නා කණ්ඩායමක් ලෙස හැඳින්වී ය. එය ඒ මහතාගේ දේශපාලන විශ්ලේෂණයක නොව කවි සංකල්පනාවක ප්‍රතිඵලයක් ලෙස දැකිය හැකි ය. මේ කරුණ විදහා දැක්වෙන නාට්‍ය පිටපතක් ද ඒ මහතා අතින් ලියැ වී ඇත. ගල් පිළිමය හා බොල් පිළිමය කෘතියෙහි සාකච්ඡා වන්නේ ද ඒ කරුණ ය. කෙසේ වෙතත් අද නම් ජ වි පෙරමුණ සිය දිවි නසාගන්නේ ද නැත් ද යන්න තීරණය කිරීමේ සන්ධිස්ථානයකට පැමිණ ඇත. දේශපාලනයේ කට්ටි පැනීම් ඇති බව සැබෑ ය. එහෙත් තීරණාත්මක අවස්ථාවල කට්ටි පැනීම්වලට ඉඩක් නැත. අද ජ වි පෙරමුණට තීරණය කිරීමට ඇත්තේ එක් ප්‍රධාන කරුණක් පමණකි. ඒ පක්‍ෂය මෙවර අයවැයෙන් ආරක්‍ෂක කටයුතු සඳහා වෙන්කර ඇති මුදල අනුමත කරන්නේ ද නැද්ද යන්න මත ජ වි පෙ සිය දිවි නසාගන්නේ ද නැද්ද යන්න තීරණය වනු ඇත. අයවැයේ ඒ ඒ කරුණ වෙන වෙන ම ගත්කල විරුද්ධ විය හැකි තැන් ඇති බව සැබෑ ය. එහෙත් යමක සමස්තය පිළිබඳ තීරණයක් ගැනීමේ දී ඒ එක් එක් කරුණට සමාන ලකුණු නො ලැබෙයි.

ජ වි පෙ ආණ්ඩුවට ඉදිරිපත් කර ඇති කොන්දේසිවලින් සමහරක් ආණ්ඩුව දැනටමත් ක්‍රියාත්මක කරන බව අපේ පිළිගැනීම ය. ඇතැම් කොන්දේසි දැනට ක්‍රියාත්මක කිරීම ඇතැම් විට උපක්‍රමශීලී නොවිය හැකි ය. ඒ කෙසේ වෙතත් කොන්දේසි නොකෙරෙන වෙදකමට සොයන කෝඳුරු තෙල් හත් පට්ටය නොවිය යුතු ය. ජ වි පෙ මේ කොන්දේසි ඉදිරිපත් කළ විගස ජාතික ව්‍යාපාරය සමග සම්බන්ධකම් පවත්වන, තමා ලෝකය විසින් පිළිගනු ලැබූ ඉහළ පෙළේ සමාජ විද්‍යාඥයකු යැයි පෙන්වීමට කැසකවන, ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන සාමාජිකයන් සමග පෞද්ගලික කෝන්තර ඇති, ජාතික ව්‍යාපාරයේ සතුරෙක් ඒ කොන්දේසිවලට ඉලෙක්ට්‍රොනික ලිපි මගින් ප්‍රචාරයක් දීමට කටයුතු කෙළේ ය. ඔහුගේ අවශ්‍යතාව කුමක් දැයි පැහැදිළි ය. ඔහු අගේ සිට කණ කන්නෙකි. මෙරට ඔහුට පිළිගැනීමක් නැතිවුවත් පිටරටවල සිටින කණ්ඩායම් සමග ඔහු සම්වන්ධකම් පවත්වයි. අප මෙවැනි පුද්ගලයන්ගෙන් ප්‍රවේසම් විය යුතු ය. ඔවුන් ජාතික ව්‍යාපාරයෙන් පිටමං කළ යුතු ය. මේ ආණ්ඩුවට ඊනියා ජාත්‍යන්තර ප්‍රජාවගෙන් කෙරුණු හා කෙරෙන නොයෙකුත් බලපෑම්වලට එරෙහිව මෙතෙක් සාර්ථකව කටයුතු කිරීමට හැකි වී තිබෙන්නේ ජාතික ව්‍යාපාරයේ ශක්තිය හේතුකොටගෙන ය. ඒ ශක්තිය තව තවත් වර්ධනය කරගැනීම ජාතියේ යහපතට හේතු වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva